# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

## නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

## පුරප්පාඩුව

## අධ්‍යක්ෂ තනතුර

2005.06.03 දින අංක1395/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද සහ 2025.06.17 දින අංක 2441/07 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2005 අංක 01 දරන ස්වාමි විපුලාතන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ ආඥා පනතේ 7.1 වගන්තියට අනුව ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලාතන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාල පාලක සභාව, 2024.01.01 දිනැති අංක 01/2024 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභා චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව, ආයතනයේ නායකත්වය භාර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ කීර්තිමත් සුදුසුකම්ලත් පුරවැසියන්ගෙන් අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත්/ නාමයෝජනා කැඳවනු ලැබේ.

මෙම ආයතනය මඩකලපුව නගරයේ සිට කිලෝමීටර 4 ක් දුරින් නව කල්මුනේ පාරේ මඩකලපුවේ කල්ලඩිහි පිහිටා ඇත. මෙම ආයතනය දෙපාර්තමේන්තු තුනකින් සමන්විතවේ. එනම් කර්ණාටක සංගීත දෙපාර්තමේන්තුව, නර්තන, නාට්‍ය සහ රංග කලා දෙපාර්තමේන්තුව සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුව. ආයතනය කර්ණාටක සංගීතය, නැටුම්, නාට්‍ය සහ රංග කලා සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා පිළිබඳ උපාධි පාඨමාලා පිරිනමයි. සේවා සපයන දෙපාර්තමේන්තුව වන තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවද ආයතනයට අයත්වේ.

අධ්‍යක්ෂවරයා ආයතනයේ පූර්ණ කාලීන නිලධාරියෙකු වන අතර ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ගිණුම්කරණ නිලධාරියා ලෙසද සේවය කරයි. ඔහු/ඇය මණ්ඩලයේ සභාපතිවරයාද, ශාස්ත්‍රීය පාලක මණ්ඩලයේ සභාපතිවරයාද වනු ඇත. අධ්‍යයන නායකත්වය ලබාදීම, කළමනාකරණ ප්‍රතිපත්ති සකස් කිරීම, මෙහෙයවීම සහ හඳුන්වාදීම සහ ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාල මණ්ඩලයේ සහ පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු/ඇය වගකිව යුතුය.

**සේවා කාලය :** අවුරුදු 03 කි

**වයස :** අවුරුදු 63 කට අවු විය යුතුය

**වැටුප් පරිමාණය :** U-AC 5 (II) - මසකට රු. 198,280 - 13 X 4,850 - 261,330/- කි

(මෙම වැටුප් පරිමාණයට වඩා වැඩි වැටුපක් ලබන අපේක්ෂකයෙකු දැනට ලබා ගන්නා වැටුප් මට්ටමටම පත් කරනු ලැබේ.)

අධක්‍ෂ තනතුරට පත් කරනු ලැබුවහොත්, ආයතනයේ සංවර්ධනය සඳහා දැක්ම ප්‍රකාශයක්,

ඔහු/ ඇය විසින් මුදුන් පත් කර ගැනීමට යෝජනා කරන දේ පිළිබඳ කෙටි විස්තරයක් සහ අයදුම්කරුගේ උපන් දිනය ඇතුළුව සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙසට අයදුම්කරුවන්ගෙන්/නාමිකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වත්මන් අධ්‍යක්ෂවරයා අයදුම්කරුවෙකු හෝ මීට පෙර ආයතනයේ අධ්‍යක්ෂ ධූරය දරා ඇති අවස්ථාවක,ඉහත ඡේදයේ සඳහන් ලේඛනවලට අමතරව, ඔහුගේ/ඇයගේ පළමු ධූර කාලය තුළ ජයග්‍රහණ උද්දීපනය කරන අයුරින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ, උසස් අධ්‍යාපන ආයතනවල සහ වෙනත් සමාන ආයතනවල දැනට සේවය කරන අපේක්ෂිත අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

ඉහත ඉල්ලා ඇති අදාළ ලියකියවිලි සහිත අයදුම්පත් නාමයෝජනා, **නියෝජ්‍ය ලේඛකාධිකාරී, පොදු පරිපාලන හා ආයතන, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව, නව කල්මුණේ පාර,කල්ලඩි පාර, මඩකළපුව**. යන ලිපිනයට යොමු කර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් 01.09.2026 දින ප.ව.3.00ට හෝ ඊට කාර්යාලයට ලැබෙන පරිදි අතින් භාර දීම කළ හැකිය.

අයදුම්කරුවන් විසින් ඉහත සඳහන් ලේඛනවල මෘදු පිටපතක් (soft copy) PDF ආකෘතියෙන් (PDF format) පහත දැක්වෙන විද්යුත් තැපැල් ලිපිනයටද යොමු කළ යුතුය.

විද්යුත් තැපැල (E-mail): **dr svias@esn.ac.lk**

අයදුම්පත සහ අවශ්‍ය ලේඛන අඩංගු ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"Application to the Post of Director, SVIAS"** ලෙස සටහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් සහ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සළකා බලනු නොලැබේ).

(අනාගත අයදුම්කරුවන්ට/නාම යෝජනා ලැබුවන්ට **www.svias.esn.ac.lk** හි ආයතනයේ වෙබ් අඩවියට පිවිසෙන ලෙස ආරාධනා කෙරේ. කොමිසම් සභා චක්‍රලේඛ අංක 01/2024 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ වෙබ් අඩවිය වන **www.ugc.ac.lk** හරහා ප්‍රවේශ විය හැකිය.)

**නියෝජ්‍ය ලේඛකාධිකාරී සහ මණ්ඩලයේ ලේකම්,**
**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය,**
**නැගෙහිර විශ්වවිද්‍යාලය,ශ්‍රී ලංකාව,**
**නව කල්මුණේ පාර, කල්ලඩි. මඩකලපුව.**
**02.08.2026**